# ධ්‍රැව දෙකක් : පිළිවෙත් දෙකක්

ඔක්තෝබර් 14 වෙනිදා තමිල්නාඩු මහ ඇමතිවරයා විසින් කැඳවන ලද පළමු සර්ව පාක්ෂික සමුළුව හතර වෙනි ඊළම් යුද්ධය මුල් කොටගෙන තමිල්නාඩුව තුළ නැගී ආ දේශපාලන විරෝධතා ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් සේ සැළකිය හැකි ය. සියල්ලටමත් වඩා කොමියුනිස්ට්වාදීන්ගේ සිට ජාතිකවාදීන් දක්වා සියළු දකුණු ඉන්දීය බලවේග පොදු ඉල්ලීම් මාලාවක් වටා ඒකාබද්ධ කළ ගුරුත්ව ලක්‍ෂ්‍යයක් බවට ඊළම් අරගලය යළිත් පත්වන ලකුණු එමගින් පෙන්නුම් කළේය. නමුත් ඉන් එහා ගිය වැදගත්කමක්ද ඊට තිබිණ.

ඒ වනවිටත් ඊළම් යුද්ධයට අදාළ ශ්‍රී ලංකා ආණ්ඩුවේ උපාය මාර්ගික සැළැස්ම මගින් පසමිතුරු හූ දේශපාලන අභිප්‍රායයන් සහිත එක්සත් ජනපදයත්, චීනයත්, ඉන්දියාවත්, පකිස්ථානයත්, ඊශ්‍රායලයත්, ඉරානයත්, රුසියාව මෙන්ම බටහිර යුරෝපයත් පළල් ශ්‍රම විභජනයකට දායක කොටගෙන තිබිණ. ඒ අනුව එක්කෝ සක්‍රීය හවුල්කරුවන් බවට මෙකී රටවල් පෙරළී සිටියහ. නැතහොත් උදාසීන නිරීක්ෂකයින් බවට ඔවුන් පත්වී තිබිණ. එම පළල් සන්ධානය නව ඊළම් යුද්ධයේ එක් බල ධ්‍රැවයක් සේ සළකතොත්, අනෙක් ධ්‍රැවය ඒ තාක් කල් සමන්විතව තිබුණේ දෙමළ ජනයාගේ ගරිල්ලා ව්‍යාපාරයෙනි. නමුත් දකුණු ඉන්දියාවේ වේගයෙන් පිබිද ආ දවැන්ත සහයෝගිතා ව්‍යාපාරයන් විසින් දෙමළ ජාතික අරගලයේ හුදකලාව නිමා කළේය. හිටි හැටියේ ඉන්දු උප මහාද්වීපය තුළින් මතුවූ පෙර නොවූ විරූ බහුජන සහයෝගිතා ව්‍යාපාරයන් දෙමළ අරගලය හා එක්ව නව ධ්‍රැවයක් නිර්මාණය කරනු ලැබිණ. රාජපක්ෂ ආණ්ඩුව විසින් ගොඩනංවන ලද **පළල් ගෝලීය යුද අක්ෂයට** යටත් කරගත නොහැකි, **නව කලාපීය දේශපාලන අක්ෂයක්** දකුණු ඉන්දියාව තුළින් නිර්මාණය කරගැනීමට දෙමළ ජාතික ව්‍යාපාරය සමත් වූයේ ඒ අනුව ය. දෙමළ ගරිල්ලා අරගලයට අදාළව පසුමුණු ප්‍රදේශයක් වශයෙන් අතීතයේ සැළකුණු දකුණු ඉන්දීය භූමිය, දෙමළ දේශපාලන අරගලයට අදාළ පෙරමුණු ප්‍රදේශයක් බවට දැන් පෙරළෙමින් තිබේ.

දකුණු ඉන්දියාව තුළ වැඩී එන කොටි හිතවාදීභාවයේ හරස්කඩක් 'ද නිවු ඉන්ඩියන් එක්ස්ප්‍රස්' පත්‍රය විසින් තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රධාන නගර 10ක් මුල්කොටගෙන පවත්වන ලද ජනමත සමීක්ෂණයක් හරහා ප්‍රකාශයට පත් කරන ලද්දේ ඔක්තෝබර් මැද භාගයේදී ය. මත සමීක්ෂණයට එක් වූවන්ගෙන් 36%ක් විසින් කොටි සංවිධානය දෙමළ ජනයාගේ එකම නියෝජිතයා වශයෙන් පිළිගෙන තිබූ අතර, තවත් 30%ක් කොටි ගරිල්ලන් විමුක්ති සටන්කරුවන් වශයෙන් පිළිගෙන තිබිණ. විශේෂයෙන්ම කොටි සංවිධානය සම්බන්ධයෙන් ඉන්දියාව තුළ දැනට ක්‍රියාත්මක තහනම වහා ඉවත් කළ යුතු බවට කල්පනා කළවුන්ගේ පංගුව 51%ක් වීම, වෙනස් වන දේශපාලන පක්ෂපාතීත්වයන් පිළිබඳ යථාර්ථයන් කදිමට අනාවරණය කොට තිබේ.

**විරෝධතා කර්ණාටකය තෙක් පැතිරේ**

ඊළම් සහයෝගිතා ව්‍යාපාරය දකුණු ඉන්දීය සමාජ දේහයේ අභ්‍යන්තරයට කා වදින ලකුණු තව තවත් පළවන්නට පටන් ගැණුනේ ඔක්තෝබරයේ මැද භාගයෙන් පසුව ය. ඔක්තෝබර් 16 වෙනිදා චෙන්නායි මහාධිකරණය සහමුලින්ම වැසී ගියේය. නීතිඥ පෝල් කණගරාජ්ගේ නායකත්වයෙන් යුතු මදුරාසි නීතිඥ සංගමය විසින් කැඳවන ලද එක්දින විරෝධතාව හේතුවෙන් සියළු අධිකරණ ක්‍රියාදාමයන් ඇණ හිටි අතර, විරෝධය සඳහා නීති විද්‍යාල සිසුන්ගේද දායකත්වයද ලැබිණ. 17 වෙනිදා වන විට, දිල්ලි පාලනය හා සන්ධානගත ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂය හා සම්බන්ධ 40 දෙනෙකුගෙන් සමන්විත මන්ත්‍රීන් කණ්ඩායම සිය ඉල්ලා අස්වීමේ ලිපි සංකේතාත්මකව මහ ඇමති කරුණානිධි වෙත භාරදුන් බව ඔක්තෝබර් 18 වෙනිදා 'හින්දු' පත්‍රය වාර්තා කළේය. ඒ අතරට මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරු දෙදෙනෙකුද ඇතුළත් වූහ.

දකුණු ඉන්දීය දේශපාලන ගිනි මැලයේ උණුසුම ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට ඒ වනවිටත් දැනෙන්නට පටන්ගෙන තිබිණ. 17 වෙනිදා කොළඹ ඉන්දීය තානාපති ආලෝක් ප්‍රසාද් ශ්‍රී ලංකා විදේශ ඇමතිවරයා හමු වී තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරන ලද බව 18 වෙනිදා 'හින්දු' පත්‍රය වාර්තා කරන ලද අතර, ශ්‍රී ලංකාවේ දෙමළ ජනයා සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පවතින තත්ත්වය පිළිබඳ ඉන්දීය මධ්‍යම ආණ්ඩුව කණස්සල්ලට පත්ව ඇති බව හඟවන ප්‍රවෘත්ති නිවේදනයක් එදිනම ඉන්දීය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කරන ලදී. ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් සී.ආර්.ජයසිංහ ඉන්දීය විදේශ ලේකම් ක්‍රිශ්ණ මෙනන් විසින් හදිසියේ කැඳවනු ලැබ ඉන්දීය රජයේ කණස්සල්ල සැළකර සිටි බවට විදේශ අමාත්‍යාංශ ප්‍රකාශක විශ්ණු ප්‍රකාශ් උපුටා දක්වමින් ඉන්දීය මාධ්‍ය වාර්තා පළවූයේද ඊට සමාන්තරව ය. ඇමරිකාව සමග එළඹුණු න්‍යෂ්ටික ගිවිසුමට එරෙහි වාමාංශිකයින්ගේ අභියෝගයෙන් සිය පැවැත්ම ගළවාගත් ඉන්දීය මධ්‍යම ආණ්ඩුව, දකුණු ඉන්දියාවේ කේවල් කිරීම් හමුවේ යළිත් අර්බුදයක් නිර්මාණය වීම වළක්වා ගැනීමට මතුපිටින් හෝ වහා පිළියම් යෙදිය යුතුව තිබිණ. ඇත්ත වශයෙන්ම අගමැති කාර්යාල නිවේදනය සහ ආලෝක් ප්‍රසාද් තානාපතිවරයා විසින් ශ්‍රී ලංකා විදේශ ඇමතිවරයා හමුවීම සැළකිය හැකි වන්නේ ඒ සඳහා ගන්නා ලද ප්‍රදර්ශනවාදී රාජ්‍ය තාන්ත්‍රික පිළිවෙත් වශයෙනි.

ගතවන සෑම දිනක්ම පාසා ඊළම් සහයෝගිතා ක්‍රියාමාර්ග නව සමාජ ක්ෂේත්‍රයන් තුළට පැතිර යාම වඩ වඩාත් වේගවත් විණ. ඔක්තෝබර් 20 වෙනිදා දකුණු ඉන්දීය සිනමා කර්මාන්තකරුවන්ගේ පළමු දවැන්ත විරෝධතාව රාමේශ්වරමට කැඳවනු ලැබ තිබුණේය. දෙමළ සිනමා නිෂ්පාදක සංගමයේත්, දෙමළ චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සංගමයේත්, සිනමා වෘත්තිකයින්ගේ බල මණ්ඩලයේත්, දකුණු ඉන්දීය චිත්‍රපට ශිල්පීන්ගේ සංගමයේත් ඒකාබද්ධ මැදිහත්වීමෙන් 2000කට වැඩි සුප්‍රකට සිනමාකරුවන් හා ශිල්පීන් රාමේශ්වරම් තුඩුවට රැස් වී ශ්‍රී ලාංකීය දෙමළ ජනයා කෙරෙහි සහයෝගය පළකර සිටියහ. එදිනම කර්ණාටක ප්‍රාන්තයේ දෙමළ ජනතා ව්‍යාපාරය විසින් කැඳවන ලද විරෝධතා ව්‍යාපාරයකට එක් වූ උද්ඝෝෂණකරුවන් බැංගලෝරයේ ගාන්ධි ප්‍රතිමාව අභියසට එක් වී ලාංකීය දෙමළ ජනයාගේ ස්වයං නීර්ණ අයිතියට සහයෝගය පළ කරමින් උද්ඝෝෂණයේ යෙදුණු බව ඉන්දීය මාධ්‍ය මෙන්ම, 'ටැමිල් නෙට්' වෙබ් අඩවියද වාර්තා කර තිබිණ.

පැතිර යන කැළඹීම් එතෙකින් නොනැවතිණ. ඉන්දු - ඇමරිකානු න්‍යෂ්ටික ගිවිසුමට සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ පිළිවෙතට වාමාංශික සහ දකුණු ඉන්දීය නියෝජිතයින් විසින් එල්ල කළ ඝෝෂාකාරී විරෝධය හේතුවෙන් ඔක්තෝබර් 21 වෙනිදා නවදිල්ලියේ පාර්ලිමේන්තු සභා වාරය තාවකාලිකව කල් තබන්නට කතානායකවරයාට සිදුවිය. කොළඹ ආණ්ඩුව ඉලක්ක කොට නිකුත් කරන ප්‍රකාශ සහ නිවේදන මගින්ද, වාචික තරවටු කිරීම් මගින්ද දකුණු ඉන්දීය විරෝධය හීලෑ

කරගත හැකිවනු ඇතැයි ඉන්දීය මධ්‍යම ආණ්ඩුව දරූ ආකල්පය දවසින් දවස දුර්වල වන ලකුණු පෙන්නුම් කළේය. ඔක්තෝබර් 23 වෙනිදා තමිල්නාඩුව පුරා පැතිර යන සේ සංවිධානය කරන විරෝධතා ව්‍යාපාරයන් මගින් දුම්රිය මාවත් හරස් කොට, දුම්රිය ධාවනය මුළුමනින්ම ඇණහිටවන ලද අතර 24 වෙනිදා ලාංකීය දෙමළ ජනයාට සහාය පල කරනු වස් සංවිධානය කළ දැවැන්ත 'මිනිස් දම්වැල'ට අනෝරා වැසි මැද දහස් සංඛ්‍යාත් ජනයා සහභාගී වූහ. චෙන්නායි නුවර උතුරේ රෝයපුරම්හි දිස්ත්‍රික් බදු නිළධාරී කාර්යාලය අසළින් ඇරඹී කාංචිපුරම් දිස්ත්‍රික්කය දක්වා කිලෝ මීටර් 61ක් විහිදුණු 'මිනිස් දම්වැල'ට ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත නායක ඩී.පාණ්ඩියන් මෙන්ම, ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත ලේකම් එන්.වර්ධරාජන්ද සහභාගී වූහ.

සති කිහිපයක් තුළ ක්‍රමානුකූලව නිවී යනු ඇතැයි ඇතැමුන් කල්පනා කළ ලංකාවේ දෙමළ ජනයාගේ ඉරණම මුල්කොටගත් දකුණු ඉන්දීය නොසන්සුන්තා, සාම්ප්‍රදායිකව ඊළමට සහාය දක් වූ පක්ෂ හා කණ්ඩායම්වල සීමිත විරෝධයන්ගේ සිට වඩ වඩාත් පැතිරුණු බහුජන සටන්වල ස්වරූපයන්ට පෙරළෙමින් තිබිණ. ඒ වනවිටත් ප්‍රධාන ධාරාවේ දේශපාලනඥයින්ගේ මැදිහත්වීම්වලින් ඔබ්බට පැතිර යාම ඇරඹී තිබූ විරෝධය, ඔක්තෝබර් 31 වෙනිදා වන විට මුලුමහත් තමිල්නාඩුවම වෙළා පැතිරගත් බහුජන නැගිටීමක ස්වභාවය ගත්තේය. සාමාජිකයින් විසිපත් ලක්ෂයකගේ දායකත්වය සහිත වෙළඳ වෘත්තීය සංගම් 5,500ක සහභාගීත්වයෙන් 31 වෙනිදා කැඳවන ලද එක්දින හර්තාල් ව්‍යාපාරය හේතුවෙන් තමිල්නාඩුවේ මෙන්ම පුදුච්චේරිහි ව්‍යාපාරික ස්ථාන මුළුමණින්ම වැසී ගියේය. *(www.freshnews.in - 31.10.2008)*ආසියාවේ විශාලතම එළවළු සහ පළතුරු වෙළඳපොළ සේ සැළකෙන චෙන්නායි කොයාම්බේඩු ආර්ථික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය සහමුලින්ම ඇණ හිටුවමින් 10,000ක් කම්කරුවෝ හර්තාලයට එක් වූහ.

ශ්‍රී ලංකා රජයේ යුදමය පිළිවෙතට හා ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ ක්‍රියා පටිපාටියට විරෝධය පළ කරමින් නොවැම්බර් 01 වෙනිදා වන විට සමස්ත දකුණු ඉන්දීය සිනමා කර්මාන්තයම උද්ඝෝෂණ ව්‍යාපාරයට හවුල් විය. රජිනි කාන්ත් සහ කමල් හාසන් ප්‍රමුඛ දකුණු ඉන්දීය සිනමාවේ පතාකයින් නාඩිගර් සංගම් ගොඩනැගිල්ලට යාබදව ඉදිරි කෙරුණු එක් පොදු වේදිකාවකට රැස්කළ දැවැන්ත එක්දින උපවාසයට සුවිශාල සිනමා රසික පිරිස්ද සහභාගී වූ බව එදිනම පළවූ *rediff.com* වෙබ් අඩවි වාර්තාවකින් හෙළි කොට තිබිණ. නොවැම්බර් 05 වෙනිදා දකුණු ඉන්දීය සිනමා වෘත්තිකයින්ගේ සංගමය විසින් කැඳවන ලද සත්‍යග්‍රහ ව්‍යාපාරය පුරා පැය 10ක් තිස්සේ පැවැති අතර යුදමය මෙහෙයුම් නවතාලීමට ඉන්දීය මධ්‍යම ආණ්ඩුවේ ප්‍රායෝගික මැදිහත්වීම එමගින් ඉල්ලා තිබිණ. *(http://news.fsmashits.com - 05.11.2008)*

### කොටි සංවිධානයේ දේශපාලන සැළැස්ම

ලැව් ගින්නක් මෙන් පැතිර යන අති දැවැන්ත දකුණු ඉන්දීය සහයෝගීතාව දෙමළ ගරිල්ලන්ගේ පැතිරුණු දේශපාලන ක්‍රියාකාරීත්වයේ විචක්ෂණභාවය සනාථ කරන කදිම නිදසුනක් විය. කොටි සංවිධානය සුපුරුදු පරිදි දකුණු ඉන්දීය භූමිය සිය යුදමය ක්‍රියාමාර්ග සඳහා සැපයුම් ආධාරක ප්‍රදේශයක් බවට පෙරළා ගනු ඇතැයි ඉන්දියානු ආරක්ෂක බළධාරීන් පමණක් නොව, රාජපක්ෂ පාලන තන්ත්‍රයද ගණන් බලා තිබූ බවට සැක නැත. ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් ඔබ්බෙහි නිරන්තර සෝදිසි නිරීක්ෂණයේ යෙදුණු ඉන්දීය නාවුක මුර යාත්‍රාවන්ගේද, දකුණු ඉන්දියාවේ වෙරළාරක්ෂක බල ඇණිවලද, ඉන්දීය ඔත්තු සේවාවන්ගේද අපේක්ෂාවන්ට පටහැනිව යමින් ඊළම් යුද ඉතිහාසයේ දකුණු ඉන්දියාව තුළින් ගොඩනංවා ගත් දැවැන්තම බහුජන දේශපාලන අරගලය කිසිවෙක් අනපේක්ෂිත ලෙස අවළුවා ගැනීමට කොටි දේශපාලන ක්‍රියාකාරිකයින් සමත්ව තිබිණ. තමිල්නාඩුව කේන්ද්‍රීයව වර්ධනය වන තත්ත්වයන් කොටි දේශපාලන අංශයේ සමීප නිරීක්ෂණයට පාත්‍රව ඇති බව තහවුරු කරමින් 'තමන් සටන් විරාමයකට හැමවිටම සූදානම්ව සිටින බව'ට විවෘත ප්‍රකාශයක් නොවැම්බර් 08 වෙනිදා කොටි දේශපාලන නායක බී.නඩේසන් විසින් කරන ලද්දේ මේ අතරතුරදී ය. කොළඹ ආණ්ඩුවේ යුද හස්තය ලිහිල් කරගනු වස් කළ ආයාචනයක් වශයෙන් කොළඹ දේශපාලනය සහ ජනමාධ්‍ය විසින් වරදවා ගන්නා ලද කොටින්ගේ ප්‍රකාශය, ඇත්ත වශයෙන්ම දකුණු ඉන්දියාව තුළ සිදුවන සියුම් දේශපාලන වර්ධනයන් නිරීක්ෂණය කරමින් කරන ලද ප්‍රකාශයක් විය. දෙදිනක් ගතවන විට කොටින්ගේ විවෘත ප්‍රකාශය අපේක්ෂිත ප්‍රතිඵල ගෙන ආවේය. නොවැම්බර් 10 වෙනිදා අගමැති මන්මෝහන් සිංට ලිපියක් යොමුකර සිටි ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු ප්‍රාන්ත ලේකම් ඩී.පාණ්ඩියන් මෙසේ ලීවේය:

''දෙමළ ජනයාගේ ව්‍යාපාරයට නායකත්වය දෙනු ලබන එල්.ටී.ටී.ඊ. සංවිධානය සටන් විරාමයක් සම්බන්ධයෙන් දරන්නේ කවර ආකල්පයක්ද යන්න දැනගනු වස් අප අදාළ ප්‍රශ්නය මතු කළෙමු. ඒ අනුව සටන් විරාමයක් පිළිබඳ නිරවුල්ව සිය අදහස් දක්වන මෙන් දෙමළ ජනයාගේ සටන් නායකත්වත්වයෙන් ඉල්ලා සිටි ප්‍රසිද්ධ ප්‍රකාශයක් අපගේ පක්ෂය විසින් නිකුත් කරන ලදී. ඔවුන් නොපමාව සාධනීය ආකාරයෙන් ප්‍රතිචාර දක්වා තිබේ. ඒ අනුව, සටන් විරාමයක් පිළිබඳ සහතිකය කොටි සංවිධානය වෙතින් ලබාගෙන ඇති අතර යුද්ධය අවසන් කිරීම සඳහා සාධනීය ප්‍රතිචාරයක් ලබාගැනීමට ශ්‍රී ලංකා ආණ්ඩුව පොළඹවා ගත යුතුව තිබේ.''

නොවැම්බර් 12 වෙනිදා තමිල්නාඩු ප්‍රාන්ත මන්ත්‍රණ සභාව යුද්ධය වහා නැවැත්වීම සඳහා ඉන්දීය මැදිහත්වීමට බලකර සිටින යෝජනාවක් ඒකමතිකව සම්මත කරගත්හ. ඊට සමාන්තරව ඒ සඳහා බල කෙරෙන බහුජන උද්ඝෝෂණ හා විරෝධතාවන් වර්ධනය කිරීමට ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය තීන්දු කොට තිබිණ. නොවැම්බර් 14 වෙනිදා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය කෙරෙහි හිතවාදී වාමාංශික සමස්ත ඉන්දීය ශිෂ්‍ය බල මණ්ඩලය විසින් ප්‍රාන්ත 18කින් කැඳවන ලද 10,000කට වැඩි සාමාජික බලවේගයන් එක්තැන් කොට නවදිල්ලිය කරා ළඟා වූ දැවැන්ත පෙළපාලියේ ප්‍රමුඛතම සටන් පාඨය බවට ලාංකීය දෙමළ ජනයාගේ අයිතීන් පත්ව තිබිණ. ජ්‍යෙෂ්ඨ කොමියුනිස්ට් නායක සී.මහේන්ද්‍රන්ගේ නායකත්වයෙන් මෙහෙය වූ 2000ක ශිෂ්‍ය කණ්ඩායමක් තමිල්නාඩුවෙන් ඊට එක්වූහ.

ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාගේ ප්‍රශ්නය මුල්කොටගෙන ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය විසින් දෙවන සර්ව පාක්ෂික සමුළුව නොවැම්බර් 17 වෙනිදා ත්‍යාගරාජා නගර්හි සාහිත්‍යන් හෝටලයට කැඳවනු ලැබුවේ ශිෂ්‍ය විරෝධයන්ටග් නිමාවත් සමගිනි. කරුණානිධිගේ ඩී.එම්.කේ. පක්ෂය සහ ජයලලිතා ජෙයරාම්ගේ අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම් පක්ෂය සමුළුවට සහභාගී නොවූවද ඊට සිය සහාය පළකර සිටින පණිවුඩ එවා තිබුණහ. ඩී. පාණ්ඩියන්ගේ ප්‍රධානත්වයෙන් රැස් වූ සමුළුවට කොමියුනිස්ට් පක්ෂයේ පළමු පෙළේ නායකයින් සහ ජ්‍යෙෂ්ඨයින් සේ සැළකෙන ආර්.නල්ලකන්නු, සී.මහේන්ද්‍රන්, කේ.පලනිසාමි, ඒ.එම්.ගෝපු සහ වයි.සිවපුණ්‍යම්ද සහභාගී වූහ. රාම්දාස්ගේ පාට්ටලී මක්කල් කච්චි, වයිකෝගේ මරුමලර්චි ද්‍රවිඩ මුන්නේත්‍ර කළහම්, නෙදුමාරන්ගේ දෙමල ජාතික ව්‍යාපාරය සහ තිරුමාවලවන්ගේ විමුක්ති දිවි සංවිධානය යන පක්ෂ සහ කණ්ඩායම්වලට අමතරව, දෙමළ දේශීය මාක්ස්වාදී පක්ෂයේද, සමස්ත ඉන්දීය පෙරටුගාමී පක්ෂයේ මෙන්ම තමිල්නාඩු මුස්ලිම් මුන්නේත්‍ර කළහම් පක්ෂයේ ද නියෝජිතයින්

ඇතුළු පක්‍ෂ සහ කණ්ඩායම් ගණනාවක් සමුළුවට එක්වූහ.

දෙවන සර්ව පාක්‍ෂික සමුළුව වඩා ප්‍රහාරක ක්‍රියාමාර්ග සඳහා පුළුල් එකඟතාවක් නිර්මාණය කර ගැනීමට වැඩි ප්‍රමුඛතාවක් දෙනු ලැබිණ. පළමු සර්ව පාක්‍ෂික සමුළුව විසින් නවදිල්ලියට ඉදිරිපත් කළ ඉල්ලීම් සම්බන්ධයෙන් කේන්ද්‍රයෙන් සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් දැඩි උද්ඝෝෂණකාරී ක්‍රියාමාර්ග පෙරට ගැනීමට පොදු ඒකමතිකත්වයක් මෙහිදී නිර්මාණය කර ගැණුනි. සමස්ත තමිල්නාඩු ප්‍රාන්තයම ආවරණය වන පරිද්දෙන් නොවැම්බර් 25 වෙනිදාට යොදාගන්නා ලද එක්දින විරෝධතා ව්‍යාපාරය එහි වැදගත්ම අංගය සේ සැළකිණ.

**එක් පිළිවෙතක්ද? පිළිවෙත් දෙකක්ද?**

ඉකුත් දශක එක හමාරක කාල වකවානුව හා සංසන්දනාත්මකව විමසා බැලීමේදී සමස්ත විරෝධතාවන්ගේ සංවිධායක භූමිකාව ඉන්දීය කොමියුනිස්ට් පක්‍ෂය අතට මාරුවීමේ ප්‍රවණතාව වැදගත් දේශපාලන හැරුම් ලක්‍ෂ්‍යයක් සළකුණු කරයි. එය දකුණු ඉන්දියාව තුළ වර්ධනය වන ඊළම් සහයෝගිතා ව්‍යාපාරය සහ ඉන්දු-ඇමරිකානු න්‍යෂ්ටික ගිවිසුමට එරෙහි වාමාංශික බහුජන ව්‍යාපාරයන් අතර විවෘත සන්ධානය එළිපිටට ගෙන එයි. 'ඊළම්වාදය ශක්තිමත් කිරීමේ ඉන්දීය-ඇමරිකානු සැළසුම්' පිළිබඳ ජවිපෙ - ජාතිපෙ වාගාලාපයන් දැනටමත් ඉන්දියාව තුළ තීරණාත්මකව මතුව පෙනෙන නව විභේදනයන්ගේ යථාර්ථයන් විසින් සහමුලින්ම අනාථ කොට අවසන් ය.

ලාංකීය දෙමළ ජනයාට සහය පළ කරනු වස් නොවැම්බර් 25 වෙනිදා ඉන්දීය කොමියුනිස්ට් පක්‍ෂය විසින් කැඳවනු ලදුව සමස්ත තමිල්නාඩු ප්‍රාන්තය පුරා ඇවිළ ගිය ඓතිහාසික එක් දින විරෝධතාව අවසාන වන විට කොමියුනිස්ට් පාක්‍ෂිකයින් හා ක්‍රියාධරයින් ප්‍රමුඛ 50,000ක් දෙනා පොලිස් අත්අඩංගුවට පත්ව තිබිණ. නොවැම්බර් 25 වෙනිදා තමිල්නාඩුව සෙළවූ ජන බලය වනාහී ඉන්දු - ඇමරිකානු සන්ධානයට එරෙහිව මාස කිහිපයකට පෙර බලමුළු ගන්වන ලද දැවැන්ත වාම විරෝධතාවන්ගේම දිගුවකි. පැහැදිලි බෙදුම් රේඛාවකින් දෙපලු කොට පෙන්වන නව ධ්‍රැවීකරණයේ එක් පැත්තකින් ශ්‍රී ලංකා රජයේ යුද වැයමට විවෘත හා ආවෘත සහාය පළ කරන නවදිල්ලිය කේන්ද්‍ර කොටගත් ඉන්දීය පාලක පන්තිය සහ එහි ආධාරක බලවේග කඳවුරු බැඳ සිටියි. අනෙක් පැත්තෙහි එකී යුද පිළිවෙතට ප්‍රතිමුඛව දෙමළ ජනයාගේ ස්වයං නිර්ණය වෙනුවෙන් විවෘත සහාය පළකරන ඉන්දීය කොමියුනිස්ට්වාදීන් ප්‍රමුඛ වාමාංශික බලවේගයන්ද, දකුණු ඉන්දීය ගොවීන්, කුල පීඩිතයින්, ශිෂ්‍ය සහ කම්කරු බලවේග කඳවුරු බැඳ සිටියි. හතරවෙනි ඊළම් යුද්ධය තුළ ඉන්දීය භූමිකාව පොදු ඒකීය ස්වභාවයක් නොදරන තීව්‍ර ධ්‍රැවීකරණයක් දැන් පෙන්නුම් කරමින් තිබේ.

ඊළම් යුද්ධය මුල්කොටගෙන ඉන්දියාව සහ ලංකාව අතර නිර්මාණය වෙමින් ඇති නව බල රටාවන් හා එමගින් ජනිත කිරීමට ඉඩ ඇති ප්‍රතිවිපාක පිළිබඳ ගැඹුරින් විමසා බැලීම මේ මොහොතේ අත්‍යවශ්‍ය කාර්යයක් බවට පෙරළී ඇත්තේ මේ දක්වා සිද්ධිමය වශයෙන් සවිස්තරාත්මකව ගෙනහැර දක්වන ලද පෙර නොවූ විරූ තරමේ වැදගත් වර්ධනයන් හේතුවෙනි.

**(මතු සම්බන්ධයි)**

**රවීස**

*raveesa@googlemail.com*

*රාවය / 2008 නොවැම්බර් 30*